*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 16-Iss. II, Dec. 2025, 87-97.*
DOI: https://doi.org/10.4038/p.v16i2.67

# The Stance of viññūs (wise individuals) When Defining the Good Bad deeds: An Enquiry into Identifying as an Early Buddhist Normative principle

## [සදාචාරාත්මක කරුණු විනිශ්චය කිරීමෙහිලා විඤ්ඤූන්ගේ ස්ථාවරය: ආදි බෞද්ධ ආචාර විද්‍යාත්මක ප්‍රාමාණික මූලධර්මයක් ලෙස හඳුනාගැනීම පිළිබඳ විමසුමක්]

**Weerawardhanalage Sumedha Manjula**[1]

**Abstract**

This study explores the stance of viññūs (wise individuals) as a normative principle in Early Buddhist ethics, particularly in defining morally good and bad actions. Early Buddhist texts, while often scattered in expression, provide a foundation for a coherent and structured ethical framework. There exists a close connection between religion and ethics in this tradition. According to Western ethical studies, Early Buddhist ethics can be recognized as a form of ethical cognitivism, and several Western scholars have highlighted their practical value in addressing contemporary moral dilemmas. Professor P.D. Premasiri has identified Sapathata Thudu Dima (Leading to happiness) and Swarnamaya Rithiya (the golden rule) as Normative ethical principles in Early Buddhism. In this research argues that the stance of viññūs (wise individuals) should also be acknowledged as a fundamental normative principle in Early Buddhism, particularly in defining morally good and bad actions. The study adopts a qualitative research approach, utilizing content analysis of primary sources. The findings confirm that Early Buddhism recognizes the judgment of viññūs as a meaningful standard in ethical evaluation. The paper concludes that incorporating this principle can further enrich ethical models based on Early Buddhist teachings, contributing to both personal moral development and broader social harmony.

**Keywords:** Early Buddhism, Normative Ethics, Viññūs (wise individuals), Sapathata Thudu Dima, Swarnamaya Rithiya (the golden rule)

1. Senior Lecturer, Department of Philosophy, University of Peradeniya, Sri Lanka.
E-mail: sumedhaw@arts.pdn.ac.lk https://orcid.org/0009-0009-4886-6624
Received: 10 June 2025, Accepted revised version: 18 November 2025.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

ආචාර විද්‍යාව දර්ශනයෙහි මූලික ශාඛාවක් වන අතර, එයින් මිනිසාගේ ක්‍රියාකාරකම්, චරිතය සහ සමාජ සම්බන්ධතා පිළිබඳ හොඳ-නරක, හරි-වැරදි, යුතුකම සහ ඇගයුම් පිළිබඳ ව විමර්ශනය කරනු ලැබේ. "Ethics" යන පදය ග්‍රීක ethos (ἦθος) යන පදයෙන් ප්‍රභවය වූවකි. එයින් චරිතය, පුරුද්ද සහ සදාචාරාත්මක ස්වභාවය අදහස් කෙරේ (Blackburn, 2001, p. 1). බටහිර දර්ශන සම්ප්‍රදායේ ආචාර විද්‍යාව ප්‍රධාන වශයෙන් අධි ආචාර විද්‍යාව (Meta-ethics), ප්‍රාමාණික ආචාර විද්‍යාව (Normative ethics), සහ ප්‍රායෝගික ආචාර විද්‍යාව (Applied ethics) ප්‍රභේද තුනකට වෙන් කර විග්‍රහ කරයි (Rachels & Rachels, 2019, p. 1). බ්‍රිතාන්‍යය විශ්ලේෂී දර්ශනයේ බලපෑම නිසා බිහි වූ අධි ආචාර විද්‍යාව මඟින් හොඳ - නරක, හරි - වැරදි වැනි සදාචාරාත්මක සංකල්පවල අර්ථය, ස්වභාවය සහ සත්‍යාසත්‍ය බව විමසා බැලේ. පදනම් මූලධර්ම මත පිහිටා කිසියම් ක්‍රියාවක් හොඳ ක්‍රියාවක් ද නරක ක්‍රියාවක් ද යන්න පැහැදිලි කරනු ලබන්නේ ප්‍රාමාණික ආචාර විද්‍යාව මඟිනි. මෙමඟින් එදිනෙදා ජීවිතයේ වාස්තවික ගැටලු සදාචාර සංකල්ප ඇසුරින් විග්‍රහ කිරීම සිදු කෙරේ. ප්‍රයෝගික ආචාර විද්‍යාව මඟින් ජෛව, නීති, පාරිසරික සහ ව්‍යාපාරික වැනි ක්ෂේත්‍රවල උද්ගත වන සදාචාරාත්මක ගැටලු ආචාර විද්‍යාත්මක වාද, සංකල්ප සහ ප්‍රාමාණික මූලධර්ම ඇසුරින් විමසා බැලීම විග්‍රහ කෙරේ.

ආගම සහ ආචාර විද්‍යාව අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධයකි. ලෝකයේ සියලුම ප්‍රධාන ආගම්වලින් පරම නිෂ්ඨාවක් සහ ඒ නිෂ්ඨාව සාක්ෂාත් කරගැනීමට උපකාර වන ප්‍රතිපදාවක් ඉදිරිපත් කරනු ලැබේ. ඒ ප්‍රතිපදාවන් අනුගමනය කර විමුක්තිය සාක්ෂාත් කිරීම සඳහා කටයුතු කරන සැදැහැවතුන් සඳහා ඒ ඒ ආගම්වලින් චර්යා ධර්ම ඉදිරිපත් කර ඇත. යමෙකු විමුක්තිලාභයට යොමු කෙරෙන සහ එයින් බැහැර කෙරෙන ක්‍රියා මොනවාද යන්න එවැනි ආගම්වලින් ඉදිරිපත් කර තිබේ. එලෙස අනුගාමිකයෙකු විමුක්තිය කෙරෙහි යොමු කෙරෙන ක්‍රියා හොඳ ක්‍රියා ලෙසත්, විමුක්තියෙන් බැහැර කෙරෙන ක්‍රියා නරක ක්‍රියා ලෙසත් ආගම්වල සාමාන්‍යයෙන් සළකනු ලැබේ.

පී.ඩී. ප්‍රේමසිරි පෙන්වා දී ඇති පරිදි ඇරිස්ටෝටල්ගේ නිකෝමැකියානු ආචාරධර්ම වැනි දාර්ශනික විමර්ශනයන්ටම කැප වූ විග්‍රහයක් බෞද්ධ මූලාශ්‍රයවල දක්නට නැතත් අංග සම්පූර්ණ ආචාරධර්ම පද්ධතියක් සකස් කර ගැනීමට අවශ්‍ය කරුණු ත්‍රිපිටකය පුරා විසිරී තිබේ. (Premasiri, 1990, p. 144). මේ පර්යේෂණ ලිපිය මඟින් පාලි බුදුසමය තුළ නිර්වාණාවබෝධය සඳහා ඉදිරිපත් කර ඇති ප්‍රතිපදාවේ අන්තර්ගත ආචාර විද්‍යාත්මක ප්‍රාමාණික මූලධර්ම මොනවාද යන්න සහ සදාචාරාත්මක කරුණු විනිශ්චය කිරීමෙහිලා විඥ්ඥූන්ගේ ස්ථාවරය ආදි බෞද්ධ ආචාර විද්‍යාත්මක ප්‍රාමාණික මූලධර්මයක් ලෙස හඳුනාගත හැකිද යන්න විමසා බැලේ.

අංගුත්තර නිකායේ, අන්ධ සූත්‍රයට අනුව ලෝකයේ වෙසෙන පුද්ගලයෝ වර්ග තුනකි. ඒ, දෑසම පෙනෙන පුද්ගලයා, එක ඇසක් පමණක් පෙනෙන පුද්ගලයා සහ දෑසම නො පෙනෙන පුද්ගලයා යන පුද්ගල වර්ග තුනයි. නොලැබුණ සම්පත් ලබා ගැනීම සහ ලැබූ සම්පත් වර්ධනය කර ගැනීම පිළිබඳ අවබෝධය, කුසල් - අකුසල්, සාවජ්ජ අනවජ්ජ, හීන-ප්‍රනීත, කණ්හ-සුක්ක, ක්‍රියා ලෙස වෙන් කර දැන ගැනීමේ නුවණ යන කරුණු දෙක සැළකිල්ලට ගෙන මේ පුද්ගල වර්ගීකරණය සිදු කර ඇත. අන්ධ පුද්ගලයා ලෙස හඳුන්වා ඇත්තේ මේ කරුණු දෙක ම පිළිබඳව ඥානයක් නැති පුද්ගලයාය. පළමු කරුණ ගැන ඥානයක් ඇතත් දෙවැනි කරුණ එනම් සදාචාරය පිළිබඳ අවබෝධයක්

නැති පුද්ගලයා එක ඇසක් නො පෙනෙන පුද්ගලයා ලෙසත්, මේ කරුණු දෙවර්ගයම පිළිබඳ ඥානයක් ඇති පුද්ගලයා දෑසම පෙනෙන පුද්ගලයා ලෙසත් එහි දක්වා ඇත (අං.නි.1, අන්ධ සූත්‍රය, 1960, 239 පි). මෙයින් පැහැදිලි වන්නේ සදාචාරමය කරුණු සම්බන්ධයෙන් අවබෝධයක් හා දැනුමක් නොමැති පුද්ගලයා බුදුසමයට අනුව එක් ඇසක් අන්ධ එනම් එක් ඇසක් පමණක් පෙනෙන පුද්ගලයෙකුට සමාන කර ඇති බවයි. බුදුසමය තුළ ආචාරධර්මවලට දී ඇති ස්ථානය එයින් පැහැදිලි වේ. තවද ආදි බුදුදහම, හොඳ-නරක ක්‍රියා; ඒ අනුව කරන ලද පුද්ගල වර්ගීකරණයන්, හොඳ-නරක ක්‍රියාවල ආනිශංස සහ ආදීනව ගැන විග්‍රහයන්ගෙන් සමන්විත වන හෙයින් වර්තමාන බටහිර දිග ආචාරවිද්‍යා විග්‍රහයන්ට අනුව බුදුදහම සදාචාරාත්මක ප්‍රජානනවාදයක් ලෙස හැඳින්විය හැකිය.

මහාචාර්ය ඩබ්. එස්. කරුණාරත්න සඳහන් කරන පරිදි කර්මයන්ගේ ගුණ ආචාර විද්‍යාත්මක වශයෙන් නිශ්චය කිරීම සඳහා කුසල-අකුසල, සුකට-දුක්කට, කණ්හ-සුක්ක, සුචරිත-දුච්චරිත, පුඤ්ඤ-පාප, කල්‍යාණ-පාපක, සේවිතබ්බ-අසේවිතබ්බ, භබ්බ-අභබ්බ යන පද සූත්‍ර පිටකයේ යෙදී ඇත (කරුණාරත්න, 1998, 37 පි.). අංගුත්තර නිකායේ, දසක නිපාතයේ, කුසල සූත්‍රයට අනුව සතුන් මැරීම, හොරකම, කාමයන්හි වැරදි හැසිරීම, බොරු කීම, කේළාම් කීම, ඵරුෂ වචන කීම, හිස්වචන කීම, දැඩි ලෝභකම, ක්‍රෝධය, වැරදි දැකීම යන කරුණු දහය අකුසල් වේ. ඒවායින් වැළකීම කුසල් වේ (අං.නි.6, කුසල සූත්‍රය, 1975, 2 පි.). එහිම ඉහත කී අකුසලයන්හි යෙදෙන පුද්ගලයන් සේවනය නොකළ යුතු අතර එකී අකුසල්වලින් වැළකෙන පුද්ගලයන් සේවනය කළ යුතුය. එහිම පඨම නිරය සූත්‍රයට අනුව ඉහත කී අකුසලයන්හි යෙදෙන්නෝ මරණින් මතු නිරයගාමී වන අතර ඉහත කී කුසලයන්හි යෙදෙන්නෝ මරණින් මතු ස්වර්ගයේ උපදිති ( අං.නි.6, 1975, 521-527 පිටු.).

ඉහත කී දස අකුසලයන්හි නියැලෙන අයත් ඒවාහි සමාදන් කරවන පුද්ගලයනුත් නිරයෙහි උපදින බවත්, ඉහත කී කුසල කර්මයන්හි තමනුත් යෙදී අනුනුත් සමාදන් කරවන අය මරණින් මතු ස්වර්ගයේ උපදින බවත් එහිම සාමඤ්ඤ වර්ගයේ, දෙවැනි සූත්‍රයේ සඳහන් වේ (අං.නි.6, 1975, 565-567 පිටු.) මෙයින් පැහැදිලි වන්නේ ක්‍රියාවන් හා පුද්ගලයින් හොඳ-නරක වශයෙන් බෙදා දැක්වීම බුදුදහමේ අන්තර්ගත වන බවයි. ''සදාචාරයෙහි ප්‍රධාන ගැටලුව වන්නේ අප, හොඳ, නරක, හරි, වැරදි , යුතු, අයුතු, ආදී වශයෙන් සදාචාරාත්මක සන්දර්භවල දී කරන නිගමන සඳහා හේතු සහිත පදනමක් ඇත්ද යන්නය '' (ඤාන්කීනා; 1998, 12-13 පිටු). මේ ගැටලුවට පිළිතුරු සැපයීමට උත්සහ කිරීම නිසා ප්‍රාමාණික ආචාරවිද්‍යා සිද්ධාන්ත බිහිවෙයි. මහාචාර්ය ප්‍රේමසිරිගේ ඉහත ප්‍රශ්න කිරීම, හොඳ- නරක, කුසල්-අකුසල්, ආදී වශයෙන් කෙරෙන ආදි බෞද්ධ වර්ගීකරණයටද ඔහු අදාළ කරගෙන ඇත. ඔහුට අනුව සදාචාරය පිළිබඳ විශිෂ්ට ප්‍රාමාණික පදනමක් බුදුසමයෙහි අන්තර්ගත වෙයි (ප්‍රේමසිරි; 1992, 2 පි.) ඔහු විසින් ආදි බෞද්ධ ආචාරවිද්‍යාත්මක ඉගැන්වීම් තුළ අන්තර්ගත ප්‍රාමාණික මූලධර්ම දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ 'සැපතට තුඩුදීම' සහ ස්වර්ණ රීතිය යන මූලධර්ම දෙකයි. පළමුවෙන්ම මේ ප්‍රමාණික මූලධර්ම දෙක පිළිබඳව සංක්ෂිප්ත අවබෝධයක් ලබාගැනීම වැදගත් වේ.

මහාචාර්ය ප්‍රේමසිරිට අනුව බෞද්ධ ආචාරධර්ම පද්ධතිය තුළ හරි හෝ වැරදි ක්‍රියා විනිශ්චය කිරීමේ දී සැපතට තුඩුදීම' යන්න වැදගත් මිනුම් දණ්ඩක් ලෙස යොදා ගැනේ (ප්‍රේමසිරි; 1992, 38 පි). මෙහිදී 'සැපතට තුඩුදීම' යන්න බුදුසමය තුළ වඩා පුළුල් අර්ථයකින් යෙදී ඇත. එය බටහිර සාධ්‍යතා සිද්ධාන්තවලදී මෙන් මෙලොව හෙවත් ලෞකික සැපත ගැන පමණක්

අවධානය යොමු නොකරයි. මෙලොව මෙන් ම පරලොව යහපතද එපමණක් නොව පරම සැපත වන නිර්වාණය ද එයින් අදහස් කෙරී ඇත. කුසලයෙහි යෙදෙන පුද්ගලයා තම යහපත මෙන්ම අනෙකාගේ යහපතද සළකා ක්‍රියා කළ යුතුය යන්න ආදි බෞද්ධ ස්ථාවරය වේ (අං.නි.2, ජවාලාත සූත්‍රය, 1962, 181-182 පි.) ක්‍රියාවක් හොඳද නරකද යන්න තීරණය කිරීමේදී සළකා බැලෙන්නේ තමාගේ යහපත පමණක් නොවේ. අනෙකාගේ යහපත සඳහා අදාළ ක්‍රියාව හේතු වන්නේ යන්න ද සළකා බැලිය යුතුය. සිතින්, කයින්, වචනයෙන් ක්‍රියා කිරීමට පෙර අදාළ ක්‍රියාව තමාට දුක් පිණිස පවතීද, අනුන්ට දුක් පිණිස පවතීද, තමාට හා අනුන්ට දුක් පිණිස පවතීද, දුක ප්‍රවර්ධනය කරන්නේද, දුක් විපාක ගෙන දෙන්නේද, සැප ගෙන දෙන්නේද, සැප විපාක ගෙන දෙන්නේද, යන්න පරීක්‍ෂා කළ යුතු බවත් බුදුරදුන් රාහුල හිමියන්ට දේශනා කර ඇත (ම.නි.2, අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය, 1993, 131-141 පිටු.) තමාගේ යහපතත් අන් අයගේ යහපතත් අපේක්‍ෂා කරන පුද්ගලයා, පරපණ නැසීමෙන්, නොදුන් දෙය ගැනීමෙන්, කාම මිථ්‍යාචාරයෙන්, බොරු කීමෙන්, සුරා පානයෙන් තමනුත් වැළකෙයි; අනුනුත් වළක්වයි (අං.නි.2, සික්ඛාපද සූත්‍රය, 1962, 191 පි.).

අංගුත්තර නිකායේ, කර්මපථ වග්ගයේ දැක්වෙන පරිදි තමාත් ප්‍රාණඝාතයෙහි, සොරකම් කිරීමෙහි, කාම මිථ්‍යාචාරයෙහි, බොරු කීමෙහි, පිසුණුබස්, පරුෂ වචන, හිස්වචන කියන, දැඩි ලෝභයේ යෙදෙන, ව්‍යාපාදයේ යෙදෙන, මිථ්‍යාදෘෂ්ටි සමාදන්වන අයෙකු වී අන් අයත්, ඒ අකුසල්වල යොදවන, ඒ අකුසල්වල ගුණ කියන, ඒ අකුසල් අනුදන්නා පුද්ගලයා මරණින් මතු නිරයෙහි උපදියි. එසේම ඒ අකුසල් ධර්මවලින් වැළකෙන, ඒවායෙහි අනුනුත් යොදවන, ඒ කුසල් ධර්ම අනුදන්නා සහ ඒ කුසල ධර්මවල ගුණ කියන අය මරණින් මතු සුගතිගාමී වෙති (අං.නි.2, 1962, 486-492 පි.).

මේ අනුව පැහැදිලි වන්නේ ආදි බෞද්ධ ආචාර ධර්මය, ප්‍රාමාණික මූලධර්මයක් ලෙස යහපත මත පදනම් ව ක්‍රියා, හොඳ නරක ලෙස වර්ගීකරණය කර ඇති බවයි. මෙලොව; පරලොව හා නිර්වාණාවබෝධය යනාදී වශයෙන් බුදුදහම තුළ යහපත, ඉතා පුළුල් සංකල්පයක් ලෙස ඉදිරිපත් කෙරී ඇත. එමෙන් ම බටහිර සාධ්‍යතාවාදී සිද්ධාන්තවල මෙන් යහපත මිනිසාට පමණක් සීමා වී නැති බව ද පැහැදිලි වේ. එබැවින් බෞද්ධ ආචාර ධර්මය මිනිස් නොමිනිස්, සත්ත්ව හා ශාක ප්‍රජාවන්ගේ පවා යහපත අපේක්‍ෂා කෙරෙන පුළුල් ආචාර ධාර්මික විග්‍රහයක් ඉරිදිපත් කර ඇති බව පැවසිය හැකි ය.

මහාචාර්ය පී. ඩී. ප්‍රේමසිරි දක්වන පරිදි ස්වර්ණමය රීතිය ද බුදුදහමේ දැක්වෙන ප්‍රාමාණික මූලධර්මයකි. ස්වර්ණමය රීතියෙන් කියැවෙන තර්කය බෞද්ධ මූලාශ්‍රයවල යෙදෙන හැටි එතුමා මෙසේ පැහැදිලි කර ඇත. '' 'X' ලෙසින් හඳුන්වන යම් ක්‍රියාවක් වේ නම් එය (අනෙකෙකු විසින්) මට කරනු ලැබීම මට රිසි නොවේ. එලෙසින්ම මා සේම සෙසු සත්ත්වයෝ ද 'X' නමැති ක්‍රියාව ඔවුනට කරනු ලැබීම රිසි නොකරති. මට කරනු ලැබීමට මා නොකැමැති දෙයක් මවිසින් ම අනුනට නොකළ යුතුය '' (ප්‍රේමසිරි; 1992, 36 පි). තමා උපමාවට ගෙන කටයුතු කරනු ලබන මේ ධර්ම පර්යාය, අත්තූපනායික ධර්ම පර්යාය ලෙස සංයුත්ත නිකායේ මහා වග්ගයේ; වේළුද්වාරෙය්‍ය සූත්‍රයේ සඳහන් වේ (සං.නි.05-02, වේළුද්වාරෙය්‍ය සූත්‍රය, 1982, 155 පි.) එහිම දැක්වෙන පරිදි ආර්ය ශ්‍රාවකයා මෙලෙස නුවණින් සළකා බැලිය යුතු ය. මම ජීවත් වීමට ප්‍රිය කරමි; නොමැරෙනු කැමැත්තෙමි. සැපයට කැමති අතර දුකට අකමැති අයෙක් වෙමි. අන් කිසිවකු විසින් මාගේ ජීවිතය නැති

කරනවාට මම කැමති නොවෙමි. එලෙස ම ම විසින් ද ජීවත් වනු කැමැති, සැප විඳීමට කැමති, දුකට අකමැති වෙනත් අයගේ දිවි තොර කරන්නේ නම් ඔවුහු ඊට අප්‍රිය අමනාප වෙති. යමක් මට අප්‍රිය අමනාප වේ නම් වෙනත් අයට ද එය අප්‍රිය අමනාප වන බැවින් එය අන් අයට කළ හැක්කේ කෙසේදැයි නුවණින් සළකා බැලිය යුතුය. එසේ සළකා බලා තමාත් ප්‍රාණඝාතයෙන්, නුදුන් දේ ගැනීමෙන්, කාමමිථ්‍යාචාරයෙන්, මුසාවාදයෙන්, පිසුනාවාචාවෙන්, පරුෂ වචනයෙන්, හිස් වචන කීමෙන් වළකියි. අන් අයවත් ඒ අකුසල ක්‍රියාවලින් වළකා ඒවායෙහි සමාදන් කරවයි. එවැනි අකුසල ක්‍රියාවලින් වෙන් වීමේ ගුණත් කියයි (සං.නි.05-02, 1982, 155 පි.).

ධම්මපදයේ, දණ්ඩ වග්ගයේ සඳහන් වන 129 සහ 130 ගාථා දෙකේ ද මුල් බුදුසමයේ පැනෙන ඉහත කී අත්තුපනායික ධර්මය අන්තර්ගත වේ. එහි දැක්වෙන පරිදි සියලු සත්ත්වයෝ දඬුවම්වලට බිය වෙති; මරණයට බිය වෙති. තම ජීවිතය තමා හට ප්‍රියවන්නේ යම්සේ ද එසේම සියලු සතුන්ගේ ජීවිතද ඔවුන්ට ප්‍රියය. එබැවින් තමා උපමා කොට කිසිදු සතෙකුගේ දිවි තොර නොකළ යුතුය, අන් අය ලවාද නොකරවිය යුතුය (ඛු.නි.1, ධම්මපද පාළි, 1960, 57පි.).

මහාචාර්ය ප්‍රේමසිරි විසින් හඳුන්වා දෙනු ලැබ ඇති ප්‍රාමාණික මූලධර්ම දෙක වන 'සැපතට තුඩුදීම' සහ 'ස්වර්ණමය රීතිය'ට අමතරව වෙනත් ප්‍රාමාණික මූලධර්ම, බෞද්ධ ආචාරවිද්‍යාත්මක ඉගැන්වීම් තුළ අන්තර්ගත වේද නැත්ද යන්න ගැන විෂය ප්‍රාමාණිකයින්ගේ අවධානය යොමු වී නැත. 'සැපතට තුඩුදීම' සහ 'ස්වර්ණමය රීතිය'ට අමතරව හොඳ-නරක නිර්ණය කිරීමෙහිලා විඤ්ඤූන්ගේ ස්ථාවරය ද ආදි බෞද්ධ ආචාරවිද්‍යාත්මක ප්‍රමාණික මූලධර්මයක් ලෙස හඳුනාගත හැකි ද යන්න මෙතැන් සිට සළකා බැලිය හැකිය.

මුල් බුදුදහමේ හොඳ-නරක ක්‍රියා පිළිබඳව සාකච්ඡා කෙරෙන බොහෝ තැන්වල ඒවා විඤ්ඤූ ගර්හිතද විඤ්ඤූ ප්‍රශස්තද යන්න ගැන අවධානය යොමු කළ යුතු බව බුදුරදුන් පෙන්වා දී ඇත. අංගුත්තර නිකායේ, තික නිපාතයේ, කාලාම සූත්‍රයේ දක්වා ඇති පරිදි ලෝභ, දෝස, මෝහ යන අකුසල මූල පස්පව් සඳහාත් පුද්ගලයාගේ අයහපත සහ අවැඩ පිණිසත් හේතු වන බව බුදුන් වහන්සේ ප්‍රකාශ කරති. ඉනික්බිතිව බුදුන් වහන්සේ කාලාමයන්ගෙන් මෙසේ විමසූහ. ''කාලාමයෙණි, ඒ කිමැයි හඟිව් ද? මේ දහම් හු කුසල් හෝ වෙත් ද? අකුසල් හෝ වෙත් ද? වහන්ස අකුසල්හ. සාවද්‍ය හෝ වෙත් ද? අනවද්‍ය හෝ වෙත් ද? වහන්ස සාවද්‍යහ. නුවණැත්තතන් විසින් ගරහන ලද්දාහු ද? නොහොත් නොගරහන ලද්දාහු ද? වහන්ස, නුවණැත්තන් විසින් ගරහන ලද්දාහ'' (අං.නි.1, කාලාම සූත්‍රය, 1960, 339 පි.). මේ අයුරින්ම කුසල ක්‍රියාවන්ට පදනම් වන කුසල් මුල් වන අලෝභ, අදෝස, අමෝහ යන ඒවා පිළිබඳව විඤ්ඤූන්ගේ ස්ථාවරයද බුදුරදුන් විසින් කාලාමයන්ගෙ න් විමසා ඇත. විඤ්ඤූන්ගේ ප්‍රසාදය කුසල් මුල් කෙරෙහිම වන බව කාලාමයෝ ඊට පිළිතුරු දුන්හ (අං.නි.1, කාලාම සූත්‍රය, 1960, 341 පි.).

යමක් අනුශ්‍රවයෙන් දැනගත් නිසා, පරම්පරාවෙන් උරුම වූ නිසා, ඉතිකිරායෙන් හෙවත් මෙසේ වීලු ලෙස දැනගත් හෙයින්, තමාගේ පිටකය හා සැසඳෙන හෙයින්, තර්කයට එකඟ වන හෙයින්, න්‍යායට එකඟ වන හෙයින්, ආකාර පරිවිතර්කයෙන්, තම දෘෂ්ටිය හා සැසඳෙන හෙයින්, යහපත් වූ ශ්‍රමණයෙක් කියූ නිසා, ගුරුවරයකු කියූ නිසා, හෝ එපමණකින් ම යමක් පිළිගැනීම සුදුසු නැතැයි යන්න ආදි බෞද්ධ ස්ථාවරයයි. අදාළ ධර්මය කුසල්ද අකුසල් ද සාවද්‍ය ද නිරවද්‍ය ද, පිළිපදින පුද්ගලයාගේ අහිත පිණිස එය පවතීද ? හිත පිණිස පවතී ද? එය පිළිපැදීමෙන් පුද්ගලයා දුකට පත්වේ ද සැපතට පත්වේ ද

යන්න මෙන් ම අදාළ ක්‍රියාව විඤ්ඤූන්ගේ ගැරහීමට ලක්වේද පැසසීමට ලක්වේද යන්නත් විමසා බැලිය යුතු බව අංගුත්තර නිකායේ, නන්දකථෙර සූත්‍රයේ මෙන්ම එහිම චතුක්ක නිපාතයේ, මහාවග්ගයේ, භද්දිය සූත්‍රයේ ද සඳහන් වේ (අං.නි.1, නන්දකථෙර සූත්‍රය, 347, 349 පිටු සහ අං.නි.2, භද්දිය සූත්‍රය, 1960 සහ 2505/1962, 371,373,375 පිටු). මෙයින් පැහැදිලි වන්නේ ක්‍රියාවක් හොඳ-නරක වශයෙන් තීරණය කිරීමේ දී අදාළ ක්‍රියාව සැපතට තුඩු දේද නැද්ද යන්න මෙන්ම එය විඤ්ඤූන්ගේ ගර්හාවට ලක්වන්නේ ද යන්නත් බුදුරදුන් විසින් විමසා බලා ඇති බවයි.

විඤ්ඤූ පුද්ගලයා කවර ස්වභාවයකින් යුතු පුද්ගලයෙක්ද යන්න විමසා බැලීම ද මේ සම්බන්ධයෙන් වැදගත් වේ. යමෙකු හැදී වැඩී දැනුම් තේරුම් ඇති වයසට පැමිණීම ද නුවණැති බවට පැමිණීම (විඤ්ඤූතං පාපුණි) ලෙස පෙළ දහමෙහි දක්වා තිබෙන බව මහාවග්ග පාළියේ දැක්වෙන පහත පාඨයෙන් පැහැදිලි වේ. ''මහනෙණි, ඉක්බිති දිසිති කොසොල් රජු ගේ මෙහෙසි තොමෝ ඒ ගැබ මේරීමට පැමිනීමෙන් පුතකු වැදුවා ය. ඔහුට ''දීඝාවු''යි නම් කළහ. මහනෙණි, ඉක්බිති දීඝාවු කුමාර තෙමේ නොබෝ කලකින් ම නුවණැති බවට පැමිණියේ ය '' (මහාවග්ග පාළි 2, 1957, 859 පි.). මෙවැනිම සඳහනක් ජීවක කෝමාරභච්ච නම් බුද්ධකාලීන වෛද්‍යවරයා සම්බන්ධයෙන්ද මහාවග්ගපාළියේම සඳහන් වේ ( මහාවග්ග පාළි 2, 1957, 675 පි.).

පාචිත්තියපාළියේ, භික්ඛු විභංගයේ, ධර්ම දේශනා ශික්ෂාපදය ගැන සඳහන් කෙරෙන තැන යම් භික්ෂුවක් විඤ්ඤූ පුරුෂයෙක් නොමැතිව මාගමකට දහම් නොදෙසිය යුතු ය. මෙහි විඤ්ඤූ පුරුෂයෙක් යනුවෙන් අදහස් කර ඇත්තේ ප්‍රතිබලසම්පන්න වූ යහපත් හා අයහපත් වචන ගැන අවබෝධයක් ඇති අයෙක් වන අතර මාගමක් ලෙස හැඳින්වෙන්නේ එවැනිම ලක්ෂණ ඇති ස්ත්‍රියකි (පාචිත්තිය පාළි, 1981, 71 පි.). විඤ්ඤූ පුද්ගලයා ගැන සිදු කරන ලද විග්‍රහයකදී ආචාර්ය උඩුහාවර ආනන්ද හිමියන් පෙන්වා දෙන්නේ පණ්ඩිත යන්න 'විඤ්ඤූ' යන්නට පර්යාය වශයෙන් යෙදෙන බවයි (ආනන්ද හිමි, 2020 මැයි 30).

සුත්ත නිපාතයේ, ඛග්ගවිසාණ සූත්‍රයේ සඳහන් වන පරිදි වනයේ ගොදුරු පිණිස හැසිරෙන තිත් මුවෙකු කිසිදු බැඳීමකින් තොරව රිසි රිසි තැන්වල හැසිරෙන්නාක් මෙන් කඟවේන අඟක් සේ හුදකලාව හැසිරීම නුවණැත්තාගේ ස්වභාවයකි (සු.නි. ඛග්ගවිසාණ සූත්‍රය, 1977, 13 පි.). චුල්ලනිද්දේසයේ, ඛග්ගවිසාණ සූත්‍ර වර්ණනාවේ විඤ්ඤූ යන්න මෙසේ පැහැදිලි කර ඇත. ''විඤ්ඤූ යනුඃ පණ්ඩිත වූයේ, ප්‍රඥා ඇත්තේ, බුද්ධි ඇත්තේ, නුවණැත්තේ විමසන නුවණ ඇත්තේ තුලිත ඥාන ඇත්තේ'' (චුල්ලනිද්දේස පාළි, 1976, 515 පි.) යනුවෙනි. සුත්ත නිපාතයේම නාවා හෙවත් ධම්ම සූත්‍රයට අනුව විඤ්ඤූ පුද්ගලයා ධර්මය ශ්‍රවණය කරන්නෙකු මෙන්ම පරහට ඉගැන්වීමට සමත් ධර්මයෙහි සූක්ෂමාර්ථ වටහා ගැනීමේ නිපුණයෙකි (සු.නි. නාවා සූත්‍රය, 1977, 95 පි.). විඤ්ඤූ පුද්ගලයාගේ ස්වභාවය පිළිබඳ මේ අදහස් මීට පෙර කියන ලද මහාවග්ගපාළියේ හා පාචිත්තියපාළියේ අදහස්වලට වඩා වෙනස් වන බව පෙනේ.

ඇතැම් නුවණැති පුරුෂයෝ උපමා මඟින් ධර්ම කරුණු පැහැදිලි කළ වහාම ඒවායෙහි අර්ථ වටහා ගැනීමෙහි සමත් වන බව දීඝනිකායේ, පායාසි රාජඤ්ඤ සූත්‍රයේත්, අංගුත්තර නිකායේ, අට්ඨක නිපාතයේ, උත්තර සූත්‍රයේත්, එහිම දසක නිපාතයේ, කෝකනද සූත්‍රයේත් දැක්වේ (දී.නි.2, පායාසි රාජඤ්ඤ සූත්‍රය, 1976, 517 පි; අං.නි. 5, උත්තර සූත්‍රය, 1977, 27 පි; අං.නි. 6, කෝකනද සූත්‍රය, 1977, 351 පි. ). සංයුක්ත නිකායේ, වේපචිත්ති සූත්‍රයට අනුව තමා

විඤ්ඤූ පුද්ගලයෙකු බව සක්දෙවිඳු විසින්ම අන් අයට පවසනු ලැබ ඇත. හෙතෙම වේපචිත්ති අසුරයාගේ පරොස් බස් ඉවසා සිටියේ ඔහුට ඇති බියක් හෝ දුබල කමක් නිසා නොවේ. නුවණැත්තෙකු වන තමන්ට එබඳු බාලයකු සමඟ සටන් කිරීම නොගැළපෙන හෙයිනි (සං.නි.1, වේපචිත්ති සූත්‍රය, 1960, 395 පි). මජ්ඣිම නිකායේ, බෝධිරාජකුමාර සූත්‍රයේ, සඳහන් වන්නේ සිදුහත් තවුසා ද සන්තිවරපදය හෙවත් නිර්වාණය සොයමින් ආළාර කාළාම සහ උද්දකරාම පුත්ත යන තවුසන් වෙතට ගිය බවයි. සිදුහත් තවුසා ඔවුන් වෙත බඹසර විසීමට කැමැත්ත පළකර සිටි විට ඔවුහු මෙසේ පැවසූහයි බෝධිරාජකුමාර සූත්‍රයේ සඳහන් වේ. ''ඇවැත්නි, වසව, යම් දහමෙකැ නුවණැති පුරිස් නොබෝකලකින්මැ සිය ඇදුරු සමය තමන් විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වසන්නේ නම් මේ දහම ද එබඳු යැයි '' (ම.නි.2, බෝධිරාජකුමාර සූත්‍රය 1993, 485,487 පිටු). මෙයින් පැහැදිලි වන්නේ නුවණැති හෙවත් විඤ්ඤූ පුරුෂයෙකු යනු විමුක්තිය සාක්ෂාත් කිරීමේ අපේක්ෂාවෙන් සිටින අයෙකු ද වන බවය.

කෙරාටික නොවූ මායා නැත්තා වූ ඍජු ස්වභාව ඇති නුවණැති පුරුෂයන්ට හෙවත් විඤ්ඤූන්ට තමන් වහන්සේ ධර්මය දෙසන බවත් එවැන්නෝ ධර්මය පිළිපැද අවිද්‍යා බැම්මෙන් මිදෙන බවත් බුදුන් වහන්සේ දේශනා කොට ඇත ( ම.නි.2, බෝධිරාජකුමාර සූත්‍රය 1993, 401 පි. ). මජ්ඣිම නිකායේ, දීඝනඛ සූත්‍රයට අනුව යමෙකු යම් දෘෂ්ටියක් දැඩිව ගෙන අන් දෘෂ්ටි සියල්ල හෙළා දකියි නම් එසේ හෙළා දැකීමට ලක් වූ දෘෂ්ටිවාදීන්ගෙන් තමාට මතවාදී අභියෝග එල්ලවන බවත්, වාද විවාද දුකට හේතු වන බවත්, වෙහෙසට හේතු වන බවත් දැන විඤ්ඤූ පුරුෂයා දෘෂ්ටි හැර දැමිය යුතුය (ම.නි.2, දීඝනඛ සූත්‍රය, 1993, 283 පි.). මජ්ඣිම නිකායේම, සන්දක සූත්‍රයට අනුව මෙලොව වසන නුවණ මද, අතිමූඪ ශාස්තෘවරයන්ගේ සසුන්හි බඹසර විසීම එනම් 'අබ්‍රහ්මචරියවාස' සහ 'අනස්සාසික බ්‍රහ්මචරියවාස' නමින් හඳුන්වා ඇති ඒවායෙහි බඹසර විසීම විඤ්ඤූන් විසින් සිදු නොකෙරෙයි. එවැනි ශාසනයක බඹසර වැසීමට විඤ්ඤූ පුරුෂයෙකුට සිදුවුවත් හෙතෙම ඒ න්‍යායන් මත පදනම්ව අකුසල ධර්මවල නොහැසිරෙයි (ම.නි.2, දීඝනඛ සූත්‍රය, 1993, 325 පි.).

දීඝනිකායේ, කස්සප සීහනාද සූත්‍රයට අනුව නුවණැති විඤ්ඤූ පුරුෂයෝ විචාරශීලී වෙති. කෙසේද යත් ලබ්ධි, කරුණු සහ ලබ්ධි කරුණු යන දෙකම ඔවුහු විචාරයට ලක්කළ යුතුය. අකුසල වූත් අකුසල සංඛ්‍යාත වූත්, සාවද්‍ය වූත් සාවද්‍ය සංඛ්‍යාත වූත්, අසේවිතව්‍ය වූත් අසේවිත සංඛ්‍යාත වූත්, ආර්ය භාවයට නොසමත් වූත්, ආර්ය භාවයට නොසමත් යැයි වෙන්කොට තබන ලද්දා වූත්, කෘෂ්ණ වූත් කෘෂ්ණ සංඛ්‍යාත වූත්, යම් ධර්මයක් වෙත් නම් බුදුරදුන් මේ දහම් නිරවශේෂයෙන්ම බැහැර කොට ඇත. එහෙත් වෙනත් ශාස්තෘවරුන් ඒවා අල්පමාත්‍ර වශයෙන් බැහැර කොට ඇතැයි යන්න සත්‍යයකි. එමෙන්ම ඉහත කී කරුණුවලට ප්‍රතිපක්ෂ වූ ධර්මය එනම් යහපත් වූ ධර්මය බුදුරදුන් නිරවශේෂ වශයෙන්ම සමාදන් වී ඇති අතර අන්‍ය ශාස්තෘවරුන් ඒවා සමාදන් වී ඇත්තේ අල්පමාත්‍ර වශයෙන් බව ලබ්ධි විචාරණ, කරුණු විචාරණ විඤ්ඤූන්ට වැටහෙයි. එබැවින් නුවණැත්තන් විසින් බුදුරදුන්ම සහ උන්වහන්සේගේ ධර්මයම පසසනු ලැබෙයි. තවද ගෞතම ශ්‍රාවක සංඝයාද නුවණැත්තන්ගේ ප්‍රශංසාවට ලක්වෙති. අන්‍ය ශාස්තෘවරුන් එසේ විඤ්ඤූ පුරුෂයින්ගේ පැසසුම් ලබන්නේ අඩුවෙනි (දී.නි.1, කස්සපසීහනාද සූත්‍රය, 1962, 361-363 පිටු.).

සංයුත්ත නිකායේ, පඨම අපුත්තක සූත්‍රයට අනුව ලාමක පුරුෂයා ධනය තෙමේත් පරිභෝග නොකරයි. අනුන්ටද නොදෙයි.

එහෙත් ධෘති සම්පන්න නුවණැති පුරුෂයා භෝග ලැබ තමාත් අනුභව කර, කළ යුතු දැද ඉටුකර නෑ සමූහයාද පෝෂණය කොට මරණින් මතු ස්වර්ගයට යයි (සං.නි.1, පඨම අපුත්තක සූත්‍රය, 1960, 169 පි.). සංයුක්ත නිකායේම, සමිද්ධි සූත්‍රයට අනුව විඤ්ඤූන් විසින් ධර්මය තම තම නැණ පමණින් වටහා ගත යුතු ය (සං.නි.1, 1960, 169 පි. 19 පි.). එහිම නිදාන වග්ගයේ පඤ්චභයවෙර සූත්‍රයේද භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ ධර්මය ස්වක්ඛාතය; සන්දිට්ඨිකය; අකාලිකය; ඒහිපස්සිකය; ඕපනයිකය; නුවණැත්තන් විසින් තම තමා කෙරෙහිලා දත යුත්තේය; එනම් විඤ්ඤූන් විසින් තම තම නැණ පමණින් ධර්මය දත යුතු යැයි කියැවේ (සං. නි. 2, පඤ්චභයවෙර සූත්‍රය, 1962, 109 පි.).

ගිහියන් අතර මෙන්ම පැවිද්දන් අතරද විඤ්ඤූහු සිටිති. පෙළ දහමේ උන්වහන්සේ හඳුන්වා ඇත්තේ විඤ්ඤූ සබ්‍රම්සරුන් වහන්සේ ලෙසිනි. විඤ්ඤූ සබ්‍රම්සරුන් වහන්සේ සීලයෙන් තමාට උපවාද කෙරේද නැද්ද යන්න පැවිදි හිමිවරුන් විසින් නිතර ප්‍රත්‍යවේක්ෂා කළ යුතු බව අංගුත්තර නිකායේ, දසක නිපාතයේ, දසධම්ම සූත්‍රයේ අන්තර්ගත වේ (අං.නි.6, දසධම්ම සූත්‍රය, 1977, 158 පි.). යම් පැවිද්දෙකු විසින් සිදු කරන ලද අල්ප වූ වරදක් දකින විඤ්ඤූ සබ්‍රම්සරුන් වහන්සේ එවැනි දුසිරිත් නොකිරීම මැනවැයි පවසත් නම් ඒ අල්ප වූ වරද සිදුකළ පැවිද්දා එම දුසිරිත් හැර කාය වාග් සුචරිතය වැඩිය යුතුය ( අං.නි.6, දසධම්ම සූත්‍රය, 1977, 73, 75 පිටු.). විඤ්ඤූ සබ්‍රම්සරුන් වහන්සේ, ප්‍රහීන නොකළ ලාමක අකුසල් ඇති භික්ෂුවට පුද සත්කාර සැළකිලි සිදු නොකරති. කුමක් නිසාද යත් උන්වහන්සේ ඒ භික්ෂුවගේ ප්‍රහීන නොවූ පාප අකුසලයන් දකින හෙයින් යැයි අංගුත්තර නිකායේ, දසක නිපාතයේ, අධිකරණික සූත්‍රයේ සඳහන් වේ (අං. නි. 6, අධිකරණික සූත්‍රය, 1977, 299; 303 පිටු).

බුදුසසුනේ පැවිදිව ශික්ෂාපද නොපුරණ භික්ෂුවට ආදීනව කීපයක් ලැබේ. ඒවා වන්නේ ශාස්තෘන් වහන්සේගේද, විඤ්ඤූ සබ්‍රම්සරුන්ගේද දෙවියන්ගේද උපවාදයට ලක්වීමට සිදු වීමයි. එපමණක් නොව එවැනි භික්ෂුවට තමා කෙරෙහිම වූ තමාගේම උපවාදවලට ලක්වීමට සිදු වේ. සසුනේ පැවිදිව ශික්ෂා පද පුරණ භික්ෂුවට ලැබෙන ආනිසංශ අතර ශාස්තෘන් වහන්සේගේ, විඤ්ඤූ සබ්‍රම්සරුන්ගේ, දෙවියන්ගේ ප්‍රශංසාවට ලක්වීම ආදිය වේ. එමෙන්ම තමා කෙරෙහි තමාගේම උපවාදයන්ද එල්ල නොවේ (ම.නි.2, භද්දාලි සූත්‍රය, 1993, 179, 181 පිටු.).

දීඝනිකායේ, උදුම්බරික සූත්‍රයට අනුව තම වැරදී නොසඟවන, නැති ගුණ නොපෙන්වනසුලු, සෘජු ස්වභාවය සහ සිහිනුවණ ඇති පුරුෂයා විඤ්ඤූ පුරුෂයෙකි. එවැන්නෙකුට උපරිමයෙන් සත්වසක්, සත්මසක් තුළ හෝ අවම වශයෙන් සත්දිනක් තුළ අර්හත්වය ලැබිය හැකිය (දී.නි.3, උදුම්බරික සූත්‍රය 1976 91, 93 පිටු.). නුවණැති විඤ්ඤූ පුරුෂයන් මොහොතක් වුව බුද්ධාදී ප්‍රාඥයන් සේවනය කළත් ඔහු වහා ධර්මය දැනගන්නා බව ධම්මපදයේ බාල වග්ගයේ හයවැනි ගාථාවේ සඳහන් වේ (ඛු.නි.1, ධම්මපද පාළි, 1960, 39 පි.). බුදුරදුන් විසින් බැහැර කරන ලද කාය වාග් මනෝ දුශ්චරිතවල යමෙකු යෙදෙයි නම් ඔහු තෙමේත් තමාට උපවාද කර ගැනීම, නුවණැත්තන්ගේ ගර්හාවට ලක්වීම, සිහිමුලාව කළුරිය කිරීමට සිදුවීම සහ මරණින් මතු විනිපාත නිරයට යෑම, ඔහුගේ අපකීර්තිය පැතිරීම යන ආදීනව ඔහුට ලැබේ (අං.නි.1, අධිකරණ වග්ගො, 1960, 115 පි.). මෙයින් පෙනී යන්නේ පුද්ගල සහ සමාජ සදාචාරයේ අභිවර්ධනයට විඤ්ඤූ පුරුෂයින්ගේ ගැරහීම හෝ ප්‍රශංසාව බලපාන බවය. අංගුත්තර නිකායේ, පඤ්චක නිපාතයේ සූත්‍ර ගණනාවකම කාය වාග් මනෝ දුශ්චරිතයේ යෙදෙන තැනැත්තාට ඉහත කී ආදීනව පහ ලැබේ.

එමෙන්ම කාය, වාග් මනෝ, සුචරිතයේ යෙදෙන තැනැත්තා තෙමේ තමාට උපවාද කර නොගනියි, නුවණැත්තන්ගේ පැසසුම් ලබයි, ඔහුගේ කීර්ති ශබ්දය පැතිරෙයි, ඔහු නොමුලාව කළුරිය කරයි, මරණින් මතු ස්වර්ගස්ත වෙයි (අං.නි.3, පඨම දුච්චරිත සූත්‍රය, 1968, 437-440 පිටු.) යන ආනිශංස පහ ලබයි.

අංගුත්තරනිකායේ චතුක්ක නිපාතයේ, අරියවංස සූත්‍රයට අනුව අරියවංස ධර්ම හතරක් ඇත. ඒවා වන්නේ (යම් භික්‍ෂුවක්) තමන් ලද චීවර, පිණ්ඩපාත, සේනාසන යන ප්‍රත්‍යවලින් සතුටු වීම සහ භාවනාවේ යෙදීමයි, අරියවංස ධර්මවලින් සමන්විත භික්‍ෂුව අතීත වර්තමාන අනාගත බුදුවරුන්ගේත්, ශ්‍රමණ බ්‍රාහ්මණයින්ගේත්, විඤ්ඤූන්ගේත් ගර්හාවට පාත්‍ර නොවේ. එසේ නොවන භික්‍ෂූන් එනම් අරියවංස ධර්ම හතර ගැන සතුටු නොවන, භාවනාවේ නොයෙදෙන භික්‍ෂුහු, බුදුවරුන්ගේත්, ශ්‍රමණ බ්‍රාහ්මණයින්ගේත්, විඤ්ඤූ පුරුෂයන්ගේත් ගර්හාවට ලක් වෙති (අං.නි.2, අරියවංස සූත්‍රය, 1962, 57, 59 පිටු.). බුද්ධ, ධම්ම, සංඝ යන රතනත්‍රයේ අචල ශ්‍රද්ධාව මෙන්ම නොකිලිටි අරියකාන්ත සීලය රකින පුද්ගලයා කිසිසේත්ම දිළින්දෙකු නොවේ. මේ අරියකන්ත සීලයද විඤ්ඤූ පුරුෂයාගේ ප්‍රශංසාවට ලක්වන්නකි ( අං.නි.2, අරියවංස සූත්‍රය, 1962, 111 පි.). සියලු ආකාරයේ සත්ත්වයින්ගේ සුවපත් බව පතන භික්‍ෂුව විඤ්ඤූන්ගේ උපවාදයන්ට හා ගර්හාවන්ට ලක් වන ඉතා සුළු හෝ ක්‍රියාවක් සිදු කිරීමෙන් වැළකෙන බව සුත්ත නිපාතයේ, මෙත්ත සූත්‍රයේ සඳහන් වේ (සු.නි, මෙත්ත සූත්‍රය, 1977, 44 පි.).

යම් ක්‍රියාවක් හොඳ ද නරක ද යන්න නිර්ණය කිරීමේ දී ඒ පිළිබඳ විඤ්ඤූන්ගේ ස්ථාවරය හා ආකල්පය කුමක්ද යන්න විමසා බැලිය යුතුය යන්න බුදුරදුන් බොහෝ අවස්ථාවල පෙන්වා දී ඇත. එනම් අදාළ ක්‍රියාව විඤ්ඤූන්ගේ සහ විඥ සබ්‍රම්සරුන්ගේ ගර්හාවට ලක්වේද ප්‍රශංසාවට ලක්වේද යන්න යන්න විමසා බැලිය යුතුය. මෙයින් පැහැදිලි වන්නේ ගිහි පැවිදි දෙපාර්ශවයම සිදුකළ යුතු නොකළ යුතු ක්‍රියා තෝරා ගැනීමේදී ඒ පිළිබඳ විඤ්ඤූන්ගේ ආකල්පය විමසා බැලිය යුතු බවය. විඤ්ඤූ පුද්ගලයෙකු යන්නෙන් අදහස් කර ඇත්තේ පණ්ඩිත වූ මනා ප්‍රඥාවක් හා බුද්ධියක් ඇති, විමසුම් නුවණින් යුතු, තුලිත ඥාන ඇති අයෙකි. නුවණැති විඤ්ඤූ පුරුෂයා දෘෂ්ටි හැර දමන්නෙකි. දෘෂ්ටි පිළිබඳ විමර්ෂණශීලි වන ඔහු සම්මාදිට්ඨිය තෝරා බේරා ගැනීමේ සමතෙකි. තවද විඤ්ඤූ පුද්ගලයා බුදුන්වහන්සේගේ ධර්මය තම තම නැණ පමණින් වටහා ගන්නා අයෙකි. හොඳ නරක පිළිබඳ විඤ්ඤූන්ගේ සහ විඥ සබ්‍රම්සරුන් වහන්සේගේ ආකල්පය ගැන සැළකිලිමත් වන ලෙස බුදුරදුන් දේශනා කර ඇත්තේ කාය වාග් මනෝ චර්යාවන් පිළිබඳව වීම මෙහි දී විශේෂ අවධානයට ගත යුතු කරුණකි. තවද විඤ්ඤූ පුරුෂයා තම වැරදි නොසඟවන, නැති ගුණ නොපෙන්වන, සිහි නුවණින් යුතු පුරුෂයෙකි. එමෙන්ම එවැන්නෝ ධර්මය වහා වටහා ගැනීමේ ස්වභාවයකින්ද යුතු වෙති. මේ අනුව පැහැදිලි වන්නේ පුද්ගල සදාචාරය සඳහාත් සමාජ සදාචාරය සඳහාත් හොඳ-නරක ක්‍රියා සම්බන්ධයෙන් විඤ්ඤූන්ගේ ආකල්පය වැදගත් වන බවයි. එබැවින් විඤ්ඤූන්ගේ ගර්හාවට ලක්වන ක්‍රියා නරක ක්‍රියා ලෙසත් ප්‍රශංසාවට ලක්වන ක්‍රියා හොඳ ක්‍රියා ලෙසත් ආදී බෞද්ධ ඉගැන්වීම් මත පදනම්ව පැවසිය හැකි ය. මේ අනුව පැහැදිලි වන්නේ මහාචාර්ය ප්‍රේමසිරි විසින් හඳුන්වා දෙනු ලැබ ඇති ප්‍රාමාණික මූලධර්ම දෙක වන 'සැපතට තුඩුදීම' සහ 'ස්වර්ණ රීතිය'ට අමතරව හොඳ-නරක නිර්ණය කිරීමෙහිලා විඤ්ඤූන්ගේ ස්ථාවරය ද ආදි බෞද්ධ අචාරවිද්‍යාත්මක ඉගැන්වීම් තුළ අන්තර්ගතව ඇති තෙවන ප්‍රමාණික මූලධර්මයක් ලෙස හඳුනාගත

හැකි බව පැහැදිලි වේ.

## ආශ්‍රිත මූලාශ්‍රය ග්‍රන්ථ නාමාවලිය

### සිංහල

### ප්‍රාථමික මූලාශ්‍රය


අංගුත්තර නිකාය (තෘතීය භාගය), බු.ජ.මු.20, (පරි. අංගුත්තර නිකාය සංසොධක මණ්ඩලය) 2512/1968,කොළඹ, ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රකාශනයකි.

අංගුත්තර නිකාය, (දෙවන භාගය), බු.ජ.මු.19, (පරි. අංගුත්තර නිකාය සංසොධක මණ්ඩලය) 2505/1962, කොළඹ, ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රකාශනයකි.

අංගුත්තර නිකාය (පංචම භාගය), බු.ජ.මු.22, (පරි.අංගුත්තර නිකාය සංසොධක මණ්ඩලය) 2520/1977, කොළඹ, ශ්‍රීලංකා ජනරජයේ ප්‍රකාශනයකි.

අංගුත්තර නිකාය (ප්‍රථම භාගය), බු.ජ.මු. 18, (පරි. අංගුත්තර නිකාය සංසොධක මණ්ඩලය) 2504/1960, කොළඹ, ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රකාශනයකි.

අංගුත්තර නිකාය (ෂෂ්ඨ භාගය), බු.ජ.මු.23, (පරි. අංගුත්තර නිකාය ශෝධක මණ්ඩලය) 2520/1977, කොළඹ, ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රකාශනයකි.

ඛුද්දක නිකාය, පංචම භාගය, බු.ජ.මු.25 (පරි.) පරවාහැර පඤ්ඤානන්ද නා හිමි, 2520/1977, කොළඹ, ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රකාශනයකි.

ඛුද්දක නිකාය- ප්‍රථම භාගය, බු.ජ.මු.24 (පරි.) අහුන්ගල්ලේ විමලකිත්ති මහ නාහිමි, 2504/1960, කොළඹ, ලංකාණ්ඩුවේ ප්‍රකාශනයකි.

චුල්ලනිද්දේස පාළි, බු.ජ.මු.34, (අනු.) ලබුගම ලංකානන්ද අනු නාහිමි සහ කරහම්පිටිගොඩ සුමනසාර හිමි, 2519/1976, කොළඹ, ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රකාශනයකි.

දීඝනිකාය, තෘතීය භාගය, බු.ජ.මු.9, (පරි. බලංගොඩ; ආනන්ද මෛත්‍රෙය මහ නාහිමි) 2519/1976, කොළඹ, ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රකාශනයකි.

දීඝනිකාය, ද්විතීය භාගය, බු.ජ.මු.8, (පරි. බලංගොඩ; ආනන්ද මෛත්‍රෙය මහ නාහිමි) 2519/1976, කොළඹ, ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රකාශනයකි.

දීඝනිකාය, ප්‍රථම භාගය, බු.ජ.මු.7 (පරි. බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහ නාහිමි) 2505/1962, කොළඹ, ලංකාණ්ඩුවේ ප්‍රකාශනයකි.

පාචිත්තිය පාළි, භික්ඛු විභංගය, බු.ජ.මු. 2 (1), (පරි.) ඉඳුරුවේ උත්තරානන්ද මහ නා හිමි, 2524/1981, කොළඹ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රකාශනයකි.

මජ්ඣිම නිකාය, ද්විතීය භාගය, බු.ජ.මු.11, (පරි. කෝදාගොඩ ඤාණාලෝක හිමි සහ කරහම්පිටිගොඩ සුමනසාර හිමි) 2516/1993, කොළඹ, ලංකාණ්ඩුවේ ප්‍රකාශනයකි.

මහාවග්ගපාළි, ද්විතීය භාගය, බු.ජ.මු.4, (පරි. අම්බලන්ගොඩ ධම්මකුසල හිමි) 2501/1957, කොළඹ, ලංකාණ්ඩුවේ ප්‍රකාශනයකි.

සංයුත්ත නිකාය, ද්විතීය භාගය, බු.ජ.මු.14, (පරි. සංයුත්ත නිකාය සංසෝධක මණ්ඩලය) 2505/1962, කොළඹ, ලංකාණ්ඩුවේ ප්‍රකාශනයකි.


### ද්විතියික මූලාශ්‍රය


ආනන්ද හිමි, උඩුහාවර, 2020/2564 මැයි 30 සෙනසුරාදා, 'බුදුරදුන්ගේ ඇරයුම කවරෙකුටද?' 'බුදුසරණ අන්තර්ජාල කලාපය,' කොළඹ: ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, https://www.budusarana.lk/budusarana/2020/05/30/tmp.asp?ID=vision07'

කරුණාරත්න, ඩබ්.එස්. 1998, කර්මය (සිංහල විශ්වකෝෂ උධෘති) කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 37පි.

ප්‍රේමසිරි, පී.ඩී. (පරි.) එන්.ජී.එස්. ජයදේව, 1992, බෞද්ධ ආචාරධර්ම, බෞද්ධ විශ්වකෝෂ සිංහල ග්‍රන්ථමාලා - අංක 01, කොළඹ: බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, 2පි.

ෆ්‍රැන්කිනා; ඩබ්. කේ. (පරි.) පී.ඩී. ප්‍රේමසිරි, 1998, ආචාර විද්‍යාව, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

## ENGLISH

Blackburn, S. (2001) Ethics: A Very Short Introduction. Oxford: Oxford University Press.

Singer, P. (2011) Practical Ethics. 3rd edn. Cambridge: Cambridge University Press.

Rachels, J. and Rachels, S. (2019) The Elements of Moral Philosophy. 9th edn. New York: McGraw-Hill.

Premasiri, P.D. (1990) ‘Ethics’, in Weeraratne, W.G. (ed.) Encyclopedia of Buddhism, Vol. V. Colombo: Government of Sri Lanka Press, p. 144.